හොඳ සිංහල

වි ක ධර්මබන්ධු

මේ ලිපිය දොඩන බාසාවෙන් ලියපු එකක්. 'සීයා නාලා' වගේ තැං "සීයා නාලා"කියලා කියන්නත් පුලුවං. එහෙම නැත්තං 'සීය නාල' කියලා අග අකුර සංවෘත 'අ' හඬින් කියන්නත් පුලුවං. හැබැයි (රුපියල්) සීය, ගල නාල (කුහරය) විදියට කියවන එක වැරදියි.

Dictionary කියන ඉංගිරිසි වචනෙ සිංහල අකුරෙන් ලියන්න ඕන කමක් ඇති උනොත් මං ඒ වචනෙ ලියන්නෙ 'ඩික්ෂනරි' කියලා. ඒ වචනෙ 'ඩික්ෂණරි' කියලා ලියන්න උනත් පුලුවං. ඒ කියන්නෙ ඒ දෙවිදියම හරි. ඒ උනාට ප්‍රශ්නය උෂ්ණය යන වචන ප්‍රෂ්ණය උශ්නය කියලා ලියන්න නං අවසර නෑ. ඒ ප්‍රෂ්නය උශ්ණය කියලා ලියන්නත් අවසර නෑ. ඒ වගේම "ශ් ෂ් - න් ණ් " අකුරු ඊට වලා හඬ ඇතිව කියන්නත් බැරිවෙන්න පුලුවං.

මට මතකයි එක්තරා පොතක ලියවිලා තිබුනා 'ඩික්ෂනිරි' කියලා. අපේ සම්මත බාසා රීතියට අනුව නං 'ඩික්ෂනරි_ ඩික්ශණරි' කියන වචන දෙකම හරි නෑ. මූර්ධජ 'ෂ' යන්න ලඟට 'ණ' යන්න ලිවීමත් තාලුජ 'ශ' යන්න ලඟට 'න' යන්න ලිවීමත් නිවැරදිය කියන මතය හින්දයි ඒ වචන දෙක හරි නෑ කියන්නෙ.

ලියනකොට කොහොම ලිව්වත් ඒ වචන කියවන කොට කියවෙන්නෙ මොන 'ශ ෂ' යන්න ද, මොන 'න ණ' යන්නද කියලා කියන්න දන්න අය ඉන්නවද කියන්න මං දන්නෑ. අද අපි ජීවත් වෙන යුගේට අනුව නං යතුරු ලියනයේ (පරිගනක) වේගය වැඩි වීම ඉතාම වැදගත්. ඒ හින්දා ලියමන සරල කරලා ලියන්න පුලුවන් නං යතුරු ලියන්නාට හුඟක් පහසුයි. ඒ වැඬේට තියෙන පලමුවෙනි ක්‍රමේ තමයි ණ, ළ, ෂ යන අකුරු තුන නොසලකා හැරීම. දෙවෙනි ක්‍රමේ තමයි තිතකිං හරි ඉරි කෑල්ලකින් හරි න, ල, ශ අකුරු තුන ණ, ළ, ෂ කිරීම. ඉංගිරිසි අකුරුවලට ඒ වගේ ලකුනු යොදලා ලියන බාසා කිහිපයක්ම මං දැකල තියෙනවා.

ඉංගිරිසි 'ඩික්ෂණරි' කියන වචනෙ තේරුම දෙන්න අපි හදා ගත්තු වචන දෙකක් තියෙනවා. 'ශබ්ද කෝෂය' එකක්. අනික 'අකාරාදිය'. 'ශබ්දය' කියන වචනෙ වැඩිපුර යෙදෙන්නෙ "හඬ"

'ටෙලිවිශන්' යන්නට හදාගෙන තියෙන්නෙ 'රූපවාහිනී' යන වචනය. ඒ අනුව 'රේඩියෝ' යන්න 'ශබ්දවාහිනී' වෙන්න ඕන. එත් එහෙම වෙලා නෑ. රේඩියෝව 'ගුවන්විදුලි යන්ත්‍රයක්' වෙලා. හඬ උස්සන - වැඩි කරන යන්තරේ - ලව්ඩ් ස්පීක යන තේරුම දෙන්න අපි හදා ගෙන තියන යන්තරේට කියන්නේ 'ශබ්ද විකාශන යන්ත්‍රය' කියලා. එකේ තේරුම හඬ විසුරුවා හරින යන්තරේ. කවිද කෙනෙක් නිදිමතේ හදාපු ඒ වචනෙ කිසිම හෙවිල්ලක් බැලිල්ලක් නැතුව අපිත් ඔහේ කියනවා; ලියනවා.

යන තේරුම දෙන්න. 'මට අමුතු සද්දයක් (ශබ්දයක්) ඇහුනා' කියන වාක්කියේ තියෙන්නෙ ඒ අදහස. ඉංගිරිසියෙ ඒ තේරුම දෙන්න noise/ sound කියන වචනෙකින්.

වියාකරන පොතේ තියෙනවා 'ශබ්ද ප්‍රකෘති - ධාතු ප්‍රකෘති' කියල ප්‍රකෘති දෙවර්ගයක්. ධාතු ප්‍රකෘති කියන්නෙ ක්‍රියාවක මදේ((stem). ශබ්ද ප්‍රකෘති කියන්නෙ නාමයක මදේට. මදේ කියන්නෙ මැද. එතන ශබ්ද යන්නේ තේරුම 'නාම'.

දම්පියා අටුවා ගැටපදේ තියෙනවලු 'වචන' යන තේරුම ඇතුව 'ශබ්ද' යන වචනෙ යෙදිච්ච තැනක්. ඒ ඇරෙන්න ඒ තේරුම ඇතුව ඒ වචනෙ යෙදිච්ච තැනක් මං දන්නෑ. අද අපි වියහර කරන බාසාවෙ නං ඒ වචනෙ ඒ තේරුම ඇතුව බාවිතා කරන්නෙම නෑ. ඒ මට හිතෙන හැටි. අපේ බාසාවෙ නාම ක්‍රියා නිපාත කියලා පද / වචන තුං වරගයක් තියෙනවා. නාම පදේකට හරි ක්‍රියා පදේකට හරි පෑහිල තනි පදයක් විදියට සකස් වෙන 'උපසර්ග' වෙනම පදයක් හැටියට ගනං ගන්නෙ නෑ. ඉතිං මේ පද නැත්තං වචන තුං වර්ගෙම හඳුන්නන්න 'ශබ්ද' යන වචනය යෙදීම හරිද මන්දා.

කොහොම උනත් දම්පියා අටුවා ගැටපදේ ඇරුනාම 'වචන' යන තේරුම ඇතුව 'ශබ්ද' යෙදිච්ච අනික් එකම තැන හැටියට කියන්න තියෙන්නෙ 'ශබ්ද කෝෂ' යන වචනෙ විතරයි. ඒ විදියට ගත්තාම 'හරකෙක් බල්ලෙක් වගේ බිරුවා' යන වාක්කිය 'හරකෙක් - බල්ලෙක්' යන නාම පද දෙකත් ශබ්ද; 'වගේ' කියන නිපාත පදෙත් ශබ්ද; 'බිරුවා' කියන ක්‍රියා පදෙත් ශබ්ද.

ඩික්ශනරියට අපි බාවිතා කරන අනික් වචනෙ 'අකාරාදිය'. අ+කාර+ආදිය = අකාරාදිය උනා කියලයි මං හිතන්නෙ. එහෙම උනා නං 'අ' යන්නෙං පටං අරං 'ළ' යන්නෙං අවසාන වෙන අකුරු මුලටයි 'අකාරාදිය' කියන්නෙ. හෝඩිය කියන්නෙත් ඒකමයි.

ඇල්ෆා බීටා (ඒ බී) කියන (ග්‍රීක් හෝඩියේ මුල්) අකුරු දෙක මුල් කර ගෙන හැදිච්ච 'ඇල්ෆබට්' යන ඉංගිරිසි වචනෙ තේරුමයි 'අකාරාදිය' යන වචනෙ තේරුමයි දෙකම එක බවයි මගේ හැඟීම. එහෙමනං ඩික්ශනරිය යන වචනෙ තේරුම 'අකාරාදියෙ' නෑ.

අන්‍ය බාසාවල වචන අපේ බාසාවෙ වචන ගිලගත්තු තැන් තියෙනවා. අපේ පොත් - පොත ඉංගිරිසි බුක් - බුකය/ බුකු - බුකුව/ බුක්ක විය යුතු නෑ. අපේ නැව් - නැව ඉංගිරිසි ශිප් - ශිපය/ ශිප්ප විය යුතු නෑ. ඒත් ඒ වගේ සිදුවීම් වෙලා තියෙනවා. නිදර්ශනයක් හැටියට කියනවා නං දෙමල බාසාවෙ පාලමයි පන්දුවයි අපේ හෙයයි බුස්සයි/ වටය ගිල ගත්තා. ඊ ලඟට ඉංගිරිසි බාසාවෙ බෝලයයි කරත්තයයි අපේ පන්දුවයි ගැලයි ගිල ගත්තා.

කොහොම උනත් අන්‍ය බාසාවලින් ආපු වචන නිසා අපේ බාසාව පෝසත් උනු බව අවිවාදයෙන් පිලගන්න ඕන. කේජු දොදොල් මැලේ (පර) බාසාව වචන දෙකක්. ගුන - රස සකු/ මගද බාසාවෙ වචන දෙකක්. බැංකුව, පෑන ඉංගිරිසි වචන. ඒ වගේ පුර්තුගීසි ලන්දේසි ඉස්පානි බාසාවලිං බිඳිච්ච වචන ටොං ගනනක් අපේ බාසාවෙ තියෙනවා. ඒ ආපු වචන හින්දා අපේ හෝඩියෙත් වෙනස්කං ඇති උනා.

අද ලෝකේ පවතින හැම බාසාවකටම වගේ ඉංගිරිසි වචන ඇතුල් වෙලා තියෙන හැටි ටෙලිවිස්නෙ එස් බී එස් ප්‍රවුර්ති අහන අයට නං රහසක් නෙවි. බාසාව හින්දා, ආගම හින්දා, ජාතිය හින්දා, හමේ පාට හින්දා මිනී මරා ගන්න ලෝකෙ එකම බාසාවක් එකම ආගමක් තිබුනා නං කොච්චර හොඳද කියලා අපට නොහිතෙන්නෙ අපේ හිත්වල මුල් ඇදපු 'මමාව' (මමත්වය) හින්දා. පිලිපීන, ඉන්දුනීසියා, වියට්නාම් බාසා ලියන්නෙ ඉංගිරිසි අකුරෙං. පිලිපීන, ඉන්දුනීසියා ප්‍රවුර්ති අහං ඉන්න කොට ඇහෙන ඉංගිරිසි වචන හින්දා ඒ ප්‍රවුර්තියෙං කියවෙන අදහස යන්තං හිතාගන්න උනත් පුලුවං.

'ටෙලිවිශන්' යන්නට හදාගෙන තියෙන්නෙ 'රූපවාහිනී' යන වචනය. ඒ අනුව 'රේඩියෝ' යන්න 'ශබ්දවාහිනී' වෙන්න ඕන. ඒත් එහෙම වෙලා නෑ. රේඩියෝව 'ගුවන්විදුලි යන්ත්‍රයක්' වෙලා. හඬ උස්සන - වැඩි කරන යන්තරේ - ලව්ඩ් ස්පීක යන තේරුම දෙන්න අපි හදා ගෙන තියන යන්තරේට කියන්නේ 'ශබ්ද විකාශන යන්ත්‍රය' කියලා. ඒකේ තේරුම හඬ විසුරුවා හරින යන්තරේ. කවිද කෙනෙක් නිදිමතේ හදාපු ඒ වචනෙ කිසිම හෙවිල්ලක් බැලිල්ලක් නැතුව අපිත් ඔහේ කියනවා; ලියනවා. මේ වගේ බාල වචන හදා ගන්නවාට වැඩිය හොඳයි ඉංගිරිසි වචනෙට සිංහල මූනුවරක් දෙන එක. ටයර් එකට 'රබර් පට්ටම්' කියන වචන දෙක බහවිතා වන බව මට මතකයි. පුංචි කාලේ අපි පෙරලපු 'ටෑර්' එක මතක් වෙනකොට ටෑර්/ ටෑර, ටැහැර්/ ටැහැර වගේ වචන කොයි තරං හොඳ ද කියලා හිතෙනවා. සමහර සුදු ගෑනු සාරි ඇන්දම අපේ ගෑනුන්ටත් වැඩිය හොඳට පේන්න පුලුවං. ඒ වගේ වෑන් 'ටැහැන' උනාම 'ටයර්/ ටෑර්/ ටැහැර උනාම ඒ වචනත් හරියට සාරියක් ඇඳපු සුදු ගෑනියෙක් වගේ වේවි. කලිසම ගැනනං කියලා වැඩක් නෑනෙ ! පහසුව, පැවැත්ම, ලාභය නිසා ඒක ලෝකෙ පුරාම පැතිරිලා.

අපි අපේ ජාතික ඇඳුමෙයි කියන්නෙ ඉන්දියාවෙන් ගත්තු පිරුවට දෙකකට. දැං සාටකේ බහවිතා වෙන්නෙ ම නෑ වගෙයි. ඒ උනාට රෙද්දයි බැනියමයි සාරියයි හැටිටෙයි ඉන්දියාවෙ ඇඳුං බව සමහරු දන්නෑ. අනුංගෙ දේවල් අරගෙන අපේය කියන එක අපට හොඳට පුරුදුයි නේ ! බුදු හාමුදුරුවො උනත් අපේ. ඉන්දියානුවො 'ඒවා හොපේ වෙන්නෙ කොහොමද කියලා' නාහන හින්දා හොඳයි.

අපේ ගමේ එක්තරා ගෑනු කෙනෙක් 'ඩික්ශනරියට' කීවෙ 'දිස්නරිය' කියලා. අපි එදා ඒකට හිනා උනා. දැං හිතෙන්නෙ ඒකෙ අනික් පැත්ත. ඇට තිබුනෙ සිංහල කටක්. අපේ කටවල් දැං සංකර වෙලා. ඉංගිරිසි 'ගෝඩ්' දෙමල කටකට 'කෝට්' වෙන්න පුලුවං, අපේ 'ගදය' ඒ කටට ම 'කත්තිය' වෙන්නත් පුලුවං. ඒ වගේ ඉංගිරිසි නුහුරු සිංහල කටකින් කියවුනු 'දිස්නරිය' ශබ්දකෝෂයටත් අකාරාදියටත් වැඩිය හොඳ බව මගේ අදහස.

අපේ සමහරු කතා බහ කරන කොට ඉංගිරිසි කෑලි දාන්නෙ සෝබනේං. ඒ වගේ වෙලාවට හිනාව කා ගෙන ඉන්නයි අපට සිද්ද වෙන්නෙ. හැබැයි අතරං පතර හිතට ගන්න ඕන තැනුත් අහු වෙනවා. තස්නාව/ තන්නාසෙ, හැන්ඩියා, කැන්ටීම ඒ වගේ තැන්. පොඩි හිනා කතාවකින් අද ලිපිය ඉවර කරන්න හිතුනා.

'අපේ ගෙදර ගාව කඩේ මුදලාලියි හාමිනෙයි දවසක් අපේ ගෙදරට ආවා. හාමිනේ ජේස්ට විබාගෙට වාඩි වෙච්ච කෙනෙක්. මුදලාලි නං අමු මැට්ටා. ඒ වගේම කුනා. ඕප දූප කතා කර කර ඉන්න අතරේ ලඟ පාත ගෙදරක දානයක් ගැන කතාව පටන් ගත්තා. ඒ පලාතෙ සාමාන්‍ය ගෙදරක දානයක් උනාම මස් කරියක් හැදෙන්නෙ කලාතුරකින්. කටට රහට මාලු ඇඹුල් කරියක් හරි හදනවා. මුදලාලි කතා කරන ගමං 'දානෙ ගෙදර නං ෆස් ක්ලාස්. කිච්චන් කරියක් එහෙමත් තිබුනා' කිව්වා විතරයි 'දැං අපි යමු. පරක්කුත් උනා. දුව හොයනවා ඇති' කියාගෙන හාමිනේ පුටුවෙන් නැගිට්ටා. මුදලාලි අන්දුං කුන්දුං වෙලා හාමිනේ පස්සෙං ගියේ හරියට හාමුදුරුවො පස්සෙං ඇඹිත්තයා යනවා වගේ. සුමානයක් හමාරක් විතර යනකං මුදලාලි අපට පේන්න එලියට පහලියට ආවෙ නෑ. මට හිතෙන්නෙ එදා හාමිනේ මුදලාලිගෙ කිචන් කරියට දෙහි කපලා මුදලාලිගෙ මූනට දෙහි මිරිකන්නත් ඇති.

සුභාෂිතයෙන්

කැලුනින් ගුනෙන් නුවනින් පසිඳු හැම තැන
සුදනන් සෙවුන නිරිඳෝ ලෝ සත රකින
දෙහිරුන් මලින් රොන් ගෙන යන මෙන් සෙමෙන
නියමින් අය ගනිති සත සිත නොතලමින

පදාවලිය

කැලුනින් ගුනෙන් නුවනින්
හැම තැන පසිඳු
සුදනන් සෙවුන
ලෝ සත රකින නිරිඳෝ
දෙහිරුන්
මලින් සෙමෙන
රොන් ගෙන යන මෙන්
සත සිත නොතලමින
නියමින් අය ගනිති

තේරුම

කරුනාව ගුනවත්කම නුවන නිසා
හැම තැනකම පසිඳු වූ (නමගිය)
සත් පුරිසුන් ඇසුරු කරමින්
ලෝක සත්වයන් (රට වැසියන්) රකින
රජවරු
බමරුන් මලින් සාමයෙන් (මලට
නොදැනෙන සේ)
රොන් ගෙන යන්නාක් මෙන්
රට වැසියන්ගේ සිත් තලන්නේ නැතිව
නියම විදියට
අය බදු ගනිති.

පැහැදුම්

පසිඳු - ප්‍රසිද්ධ සිංහලට බිඳෙන්නේ පසිදු යනුවෙනි. පසුව පසිදු ම පසිඳු වේ. කලබ ම කලඹ වන්නේත් ඒ නියරට අනුවයි. පරසිඳු, පිරිසිඳු, තරඟ යන පද සමහරුන් බහවිතා කරන්නේ මේ රීතියේ ආරක්සාව ඇරැක්ම ඇතිවය.

සෙවුන

සේවනය කිරීමේ 'සෙව' දාවෙන් සෙවී - සෙවිති - සෙවී සෙවී යන ක්‍රියා පද හැදේ. එසේම එයින් සෙවනු, සෙවන, සෙවී, සෙවුනු, සෙවුණු යන කෘදන්ත නාම පදත් හැදේ. 'සෙවුන' යනු 'සෙවුනු' යන්නේම තවත් රූපයකි එතැන මූර්ධජ 'ණ' විය යුතුය.

ලෝ සක/ සත

මේ පද දෙකම 'රටවැසියා' යන තේරුම් දීම සඳහා බහවිතා කර ඇත. එසේ කර ඇත්තේ ඒරිත රැකීම සඳහාය.

දෙහිරුන්

මී මැස්සන් සඳහා මේ පදය යෙදී ඇති අන් තැනක් ගැන නොදැනිමි. මේ වචනය සුමංගල ශබ්ද කෝෂයේවත් නැත. දෙහිරුන් දෙබරුන් දෙවර්ගයකි.

සෙමෙන්

සෙමින් - හෙමිං යනු 'සාම' යන්නෙන් බිඳී ඇති බව පෙනේ. 'කැරලි මැඬ පවත්වා රට සෙමෙහි තබා' යන්නේ 'සෙම' මෙහි මදයයි. Slowly – peas fully යන තේරුම් දෙ ම සඳහා මෙය බහවිතා කෙරේ.

වි. ක. ධර්මබන්ධු

WESTERN LANKA

නව ශ්‍රී ලාංකික වෙළඳ සැල

WESTERN LANKA SPICES

WERRIBE QUARBING STREET හි

MANORVALE PRIMERY SCHOOL

(IGA SUPERMARKET සිට කිමී 1/2 දුර)

අලුළුත් සහ පරණ

සිංහල වෙලි නාට්‍ය

ශ්‍රී ලාංකික පුවත් පත්

සිංහල හින්දි ගීත CD

PHONE CARDS

FRESH රමිපෙ කරපිංචා

සියලුම සහල් වර්ග

ශ්‍රී ලාංකික සහ ඉන්දීය කුළුබඩු

ටින්කල සහ බෝතල් කල ආහාර

ශීත කල ආහාර

ඇතැලු බොහෝ දේ

4 QUARBING ST WERRIBEE හි

WESTERN LANKA වෙතින්

(CNR. GREAVES NORTH ST & QUARBING ST)

MEL REF. 205 F6

PHONE : 97422487, 0402335450

OPEN 7 DAYS FROM 10.00 AM TO 7.00 PM